# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: සසං‍දෙ/බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.01. 01

නියාමන උපදෙස් බැ/නි/ඒ/2021/01

සමුපකාර සමිති/ සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**දූෂ්කෘත නිවේදන හෙවත් විෂමාචාර කටයුතු පිළිබඳව අවධිමත්ව කෙරෙන සන්නිවේදනයන් (Whistle Blowing Policy)**

**01.** හැඳින්වීම

දූෂ්කෘත නිවේදනයන් යනු, ආයතනයක සිදු වන වැරදි, අක්‍රමිකතා, නීතියට පටහැනි ක්‍රියා, වංචා, ප්‍රතිපත්තිමය විෂමතා පිළිබඳව උනන්දුවක් දක්වන, ආයතනයකට ලැදි පාර්ශවයන් විසින් නාමිකව හෝ නිර්ණාමික ලිපි, දුරකථන ඇමතුම්, E – mails, SMS ආදී සන්නිවේදන මාර්ග තුළින් සිදු කෙරෙන කරුණු දැක්වීම් ය.

**02.** ක්‍රමවේදයන්

- දූෂ්කෘත නිවේදනයන් සිදු කරන පාර්ශවයන් දූෂ්කෘත නිවේදනකරු (Whistle Blower) ලෙස සැළකේ.
- අතීතයේදී මෙම සන්නිවේදනයන් සාවද්‍ය සහ සැළකිල්ලට ගත යුතු නොවන ඒවා ලෙස සැළකුව ද වර්තමානයේ දී මෙම සන්නිවේදනයන් ව්‍යාපාරික කටයුතු සහ ආයතනයේ යහපත්භාවයට සහ තිරසාරත්වයට උපයෝගී කර ගැනීමේ කළමනාකරණ පරිචයක් ලෙස හඳුන්වා දී ඇත.
- ආයතනයේ දියුණුව සහ යහපැවැත්ම පිළිබඳව උනන්දුවක් දක්වන, ආයතනයේ අභ්‍යන්තර සේවකයන්, බාහිර පාර්ශවයන් හෝ පොදු ජනතාව විසින් ද්වේෂ සහගත අපේක්ෂාවන්ගෙන් තොරව, සද්භාවයෙන් ඉදිරිපත් කරන මෙවැනි සන්නිවේදනයන් පිළිබඳව ආයතන ප්‍රධානීන් සහ වගකිව යුතු පාර්ශවයන් නිසි අවධානය යොමු කර ප්‍රෝත්සාහීව (Proactively) කටයුතු කිරීම තුළින් අනාගතයේදී සිදු වීමට ඉඩ ඇති විශාල අලාභයන්, හානිකර තත්ත්වයන්, තැන්පත්කරුවන්ගේ අරමුදල් ආපසු ගෙවීමට නොහැකි පරිදි සිදු විය හැකි ද්‍රවශීලතා අර්බුද, සම්පත් අවභාවිතයන් සිදු වීමට ඇති ඉඩකඩ වළක්වා කල් ඇතිව ඒවා පිළිබඳව නිවැරදි කිරීමේ තීරණයන් ගැනීමට සහ කටයුතු සිදු කිරීමට හැකි වනු ඇත.
- ඊර්ෂ්‍යා සහගතව, පළිගැනීම් චේතනා වලින් මෙවැනි සන්නිවේදනයන් ඉදිරිපත් විය හැකි වන අතර, නිසි විචක්ෂණශීලීත්වය තුළින් දූෂ්කෘත නිවේදනයන්ගේ සාධාරණ බව සහ නිරවද්‍යතාව නිසි ලෙස අවබෝධ කර ගැනීමෙන් පසුව පමණක් ඒවා සඳහා පියවර ගැනීම අපේක්ෂා කෙරේ.

තවද, දූෂ්කෘත නිවේදනයන්ගේ ව්‍යාජත්වය සහ පළිගැනීමේ අපේක්ෂාවෙන් කරන ලද බව පරීක්ෂණ හා විමර්ශණයන්ගෙන් (Investigation and Inquiries) නිරීක්ෂණය වුවහොත් සහ එවැනි පාර්ශවයන් නිවැරදිව හඳුනා ගතහොත් නිසි විනය පියවරයන් ගනිමින් අනාගතයේදී ව්‍යාජ දූෂ්කෘත නිවේදනයන් ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ වළකා ගැනීම මේ සම්බන්ධ වගකිව යුතු ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ වගකීමක් වේ. එසේ වුවද, දූෂ්කෘත නිවේදනය ඉදිරිපත් කරන්නා ඔහු හෝ ඇය මතු කරන කාරණය සත්‍යයක් යැයි සද්භාවයෙන් විශ්වාස කරන්නේ නම්, ඔහු හෝ ඇය වරදක් කර ඇතැයි නොසැළකිය යුත්තේ ය.

- දූෂ්කෘත නිවේදනයන් කලමනාකරණ මෙවලමක් විනා (Management Tool) තමන් අකමැති පාර්ශවයන්ට පළිගැනීමට සහ දඬුවම් කිරීමට භාවිතා කරන කලමනාකරණ අවියක් (Management Weapon) නොවිය යුතු ය.

**03. දූෂ්කෘත නිවේදන සම්බන්ධ ක්‍රියාන්විතය (Operational Mechanism of Whistle Blowing)**

- මෙවැනි දූෂ්කෘත නිවේදන කරනු ලබන (Whistle Blower) පාර්ශවයන්ගේ රහස්‍යතාව රැකිය යුතු ය.
- අදාළ සිද්ධිය පිළිබඳව දින 3ක් තුළ ක්‍රියාත්මක වී මූලික විමර්ශණයක් කළ යුතු ය.
- දූෂ්කෘත නිවේදනයෙන් පෙන්වා දී ඇති දූර්වලතා, අක්‍රමිකතා, වංචා සහ සාවද්‍ය පරිචයන් සත්‍ය බව නිරීක්ෂණය වන්නේ නම් අප්‍රමාදව ඒවා නිවැරදි කිරීමට පියවර ගත යුතු ය.
- ප්‍රවර්තන මඟපෙන්වීම්, උපදෙස් සහ චක්‍රලේඛ ප්‍රමාණවත් නොවන්නේ නම්, සංශෝධනය කර නිවැරදි කිරීමට පියවර ගත යුතු ය.
- කිසිසේත් දූෂ්කෘත නිවේදනයන් සම්බන්ධව නොසැලකිලිමත්ව කටයුතු කිරීමට හෝ එකවර ප්‍රතික්ෂේප කිරීමට කටයුතු නොකළ යුතු ය.
- දූෂ්කෘත නිවේදනයන් සම්බන්ධව නිසි ලිපි ගොනු පවත්වා ගෙන යමින්, ගත් පියවරයන්හි ප්‍රගතිය පසු විපරම් කරමින් ඒවායේ පෙන්වා දී ඇති දූර්වලතා යළි ඇති නොවීමට කටයුතු කිරීම සියළුම නිලධාරීන්ගේ වගකීමක් බව සිහිපත් කරමි.

මෙම කලමනාකරණ ක්‍රමවේදය ශ්‍රී ලංකාවට මෑතකදී හඳුන්වා දෙන ලද්දක් වන හෙයින් මෙම නියාමන උපදෙස් ඔබ සමිතියේ/ සංගමයේ සේවක මණ්ඩළය දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව අවධාරණය කරමි.

සුචින්ද එස්. සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

**පිටපත් -**

| | | | |
|---|---|---|---|
| 1. | නියෝජ්‍ය කොමසාරිස් (සමුපකාර) | - | අ.ක.ස. |
| 2. | සහකාර කොමසාරිස් (විගණන/ඇවර) | - | අ.ක.ස. |
| 3. | සමිති අධීක්ෂණ/ විගණන නිලධාරීන් | - | සමිති/සංගම්හි අධීක්ෂණයේ දී හා විගණනයේ දී අවශ්‍ය කටයුතු සඳහා |